**කාර්මික තාක්ෂණ ආයතනය - 2017**

**--------------------------------------**

කාර්මික තාක්ෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපතිවරයා වෙත 2018 මැයි 14 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කාර්මික තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

--------------------------------------------

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂික ව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.561,756,774 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයෙහි 72 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකින් වෙන් කළ හැකි වත්කම් බැවින් වෙන් වෙන්ව ගිණුම් තැබිය යුතුය. එසේ වුවද ආයතනය විසින් මාලඹේ පිහිටි රු.40,000,000 ක් වටිනා පර්යේෂණ හා සංවර්ධන ගොඩනැගිල්ල පිහිටි ඉඩම, ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂය සඳහා රු.2,000,000 ක් ක්ෂය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9

-------------------------------------------

ප්‍රමිතයෙහි 35 වගන්තිය ප්‍රකාරව අවසන් භාණ්ඩ තොගයේ පිරිවැය ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමය හෝ භරිත සාමාන්‍ය ක්‍රමය යන පිරිවැය ක්‍රම යොදාගනිමින් නිශ්චය කළ යුතු වුවද ආයතනය එකී ක්‍රම අනුගමනය නොකර සරල සාමාන්‍ය පිරිවැය ක්‍රමය මත අවසාන භාණ්ඩ තොගයේ වටිනාකම ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය කාර්යාලය හා තාක්ෂණික පැවරුම් ඒකකය බෞද්ධාලෝක මාවතේ පිහිටි කාර්මික තාක්ෂණ ආයතන ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම වෙනුවෙන් මාසයකට රු.1,368,050 ක කුලියක් ගෙවීමට ගිවිසගෙන තිබුණි. ඒ අනුව 2017 ජුනි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මාස 07 ක කාලයකට රු.9,576,350 ක් ආයතනයට ලැබිය යුතු වුවත් ලැබිය යුතු ආදායම රු.8,200,300 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් ලැබිය යුතු කුලී ආදායම රු.1,376,050 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) යුරෝපා සංගමයේ මූල්‍ය ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘතියක් ගිවිසුම්ගත පරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සිදුවූ අලාභ පියවීම සඳහා 2014 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය යුරෝපා සංගමය වෙත ආපසු ගෙවීමට තීරණය කර තිබූ මුදලින් තවදුරටත් ගෙවිය යුතු රු.12,300,860 ක් සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

**2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් 15 (ඒ) අනුව 2017 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනීම් අත්තිකාරම් (දේශීය) ශේෂය රු.3,456,439 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම ශේෂය රු.3,209,274 ක් වීමෙන් රු.247,165 ක වෙනසක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැති ශේෂය රු.16,534,423 ක් වුවත් ණයගැති වයස් විශ්ලේෂණ වාර්තාව අනුව එම ශේෂය රු.16,528,839 ක් වීම හේතුවෙන් රු.5,584 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2018 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2017 දෙසැම්බර් 31 දිනට පිරියත උපකරණ හා පරිගණකාගාර උපකරණ, ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ හා පරිගණක හා උපාංග වටිනාකම් පිළිවෙලින් රු.1,058,322,445, රු.81,819,207 ක් හා රු.73,299,744 ක් විය. ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම වත්කම්වල පිරිවැය පිළිවෙලින් රු.1,127,303,844, රු.84,900,135 ක් හා රු.67,049,915 ක් විය. මේ හේතුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ සඳහන් වටිනාකම්වලට රු.65,812,498 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කර තිබුණි. තවද, ජංගම නොවන වත්කම් යටතේ සඳහන් පිරිවැය රු.4,512,574 ක් වටිනා වෙනත් වත්කම් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට ඇතුලත් කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට අයවිය යුතු විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකල නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.7,810,032 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ සේවයෙන් ඉවත්ව ගිය හා සේවයේ රැඳී සිටින නිලධාරීන් සඳහා ගෙවිය යුතු වැටුප් ලෙස 2009 වර්ෂයේදී රු.6,845,135 ක වෙන් කිරීමක් කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දින වන විටත් එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වූ උපචිත වියදම් ගිණුම් ශේෂ එකතුව රු.793,919 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 05 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවත එන රු.2,858,744 ක ණයගැති ශේෂ 9 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 19(2) වගන්තිය | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය, සාමාජිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2017 ඔක්තෝබර් 03 දින වන විට කළමනාකරණ මණ්ඩලය සාමාජිකයින් 08 දෙනෙකුගෙන් පමණක් සමන්විත විය. |
| (ආ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 7.1 වගන්තිය | උපදේශන සේවා ආදායමින් සෘජු පිරිවැය අඩු කළ පසු සියයට 10 ක සිට සියයට 25 ක් දක්වා ප්‍රතිශතයක මුදලක් ආයතනය මඟින් රඳවාගෙන ඉතිරි මුදල භාණ්ඩාගාරයේ විශේෂ අරමුදලක් වෙත මාස 03 කට වරක් යැවිය යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 වගන්තිය | ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතියේ ඵලදායි බව සමාලෝචනය කිරීම සඳහා ණයගැති හා ණයහිමි ආයු විශ්ලේෂණ වාර්තාව, තොග ආයු විශ්ලේෂණ වාර්තාව හා හඳුනාගත් පැරණි, මන්දගාමීව චලනයවන හා කල් ඉකුත් වූ තොග පිළිබඳ වාර්තාව සෑම මාසික කළමනාකරණ මණ්ඩල රැස්වීමකදීම සභාගත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2011 අප්‍රේල් 21 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2011/1 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව 2015 වර්ෂයේදී රු.2,443,833 ක් වටිනා කොරියානු ව්‍යාපෘතියක් සහ 2013 වර්ෂයේදී රු.9,471,966 ක් වටිනා ඉන්දු ශ්‍රී ලංකා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2016 ජනවාරි 08 දිනැති අංක 1/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 13 දෙනෙකු හා කාර්යභාර පදනම මත සේවකයින් 64 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් ලෙස රු.17,882,181 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා භෞතික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (උ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | පුරප්පාඩු තනතුරුවල කටයුතු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 14 දෙනෙකු බඳවාගෙන තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,508,341 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.56,290,243 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 60,798,584 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ගිවිසුම්ගත සේවා වියදම පිළිවෙලින් රු.48,297,921 කින් හා රු.15,426,297 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.39,177,699 ක් වූ අතිරික්තය උච්ඡාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.56,290,243 ක අතිරික්තයක් වුවද 2017 වර්ෂයේදී රු.4,508,341 ක පිරිහීමක් බවට පත් වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් හා බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.365,884,413 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2017 වර්ෂයේදී රු.496,769,412 ක් විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ගණනය කරන ලද කාරක ප්‍රාග්ධන අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2017 වර්ෂය | 2016 වර්ෂය |
|---|---|---|
| ජංගම | 2.28:1 | 6.76:1 |
| ක්ෂණික | 2.24:1 | 6.67:1 |

2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී ජංගම හා ක්ෂණික අනුපාත පිළිවෙලින් සියයට 66.27 කින් හා සියයට 66.41 කින් පහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම වගකීම් රු.204,227,710 කින් එනම් සියයට 159 කින් වැඩිවීම මේ සඳහා හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලසුමෙහි සඳහන් කාර්යයන් ඉටු කළ බවට හඳුනාගත හැකිවන පරිදි ප්‍රගති සමාලෝචන වාර්තා පිළියෙල කර නොතිබීමෙන් ඉලක්කගත සැලසුම් හා ආයතනයේ ප්‍රගතිය සන්සන්දනය කිරීම අපහසු විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතිගත සේවා ආදායමට ඇතුලත්වන තාක්ෂණික පරීක්ෂාවන් සඳහා ආයතනය වෙත ඉදිරිපත් කරන ලද සාම්පල් නියමිත දිනට ගණුදෙනුකරුවන් වෙත ලබාදීමට කටයුතු කර නොතිබු බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් 2017 අගෝස්තු මාසය පදනම් කරගෙන සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අවස්ථාවන් 23 කදී දින 02 සිට දින 32 දක්වා කාල ප්‍රමාදයකින් යුක්තව වාර්තාවන් ගණුදෙනුකරුවන් වෙත නිකුත් කර තිබුණි.

(ආ) ආයතනය තුළ පවතින ඊටීඑල්, ආර් ඇන්ඩ් ඩී, එෆ්ටීඑස්, එච්ටීඑස්, හා එම්ටීඑස් (ETL, R&D, FTS, HTS, හා MTS) පරීක්ෂණාගාරවලින් සිදුකරන පරීක්ෂාවන් සඳහා වාර්තා නිකුත් කිරීමේ දිනයන් ආයතනය විසින් පූර්ව නිශ්චය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද නියදි පරීක්ෂාවේදී 2017 අගෝස්තු මාසයේදී අවස්ථාවන් 14 කදී සිදුකරන ලද පරීක්ෂණවලින් පරීක්ෂණ 03 ක වාර්තා 2017 ඔක්තෝබර් 17 දින වන විටත් නිකුත් කර නොතිබුණි.

(ඇ) ආයතනය විසින් විවිධ ආයතන වෙත උපදේශක සේවා සැපයීමේදී එකී වාර්තා නියමිත දිනට නිකුත් කර නොතිබු අවස්ථා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් 2017 මාර්තු මාසය පදනම් කර ගනිමින් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අවස්ථා 9 කින් අවස්ථා 7 කදී දින 20 සිට දින 94 දක්වා ප්‍රමාදයකින් යුතුව වාර්තා නිකුත් කර තිබු අතර අවස්ථා 2 කදී 2017 ඔක්තෝබර් 10 දින වන විටත් එකී වාර්තා නිකුත් කර නොතිබුණි.

(ඈ) ආයතනය විසින් එකතුව රු. 6,705,607 ක් වටිනා ෆ්ලෝරසන්ට් රිසර්ඩ් මයික්‍රොස්කෝප් විත් ෆේස් කන්ට්‍රාස්ට් ඔබ්ජෙක්ටිව්ස් (Finorent Reasearch Microscope with phase contract objectives) උපකරණය හා ඉන්කියුබේටර් විත් ඔබ්ටිකල් ෂේකර් උපකරණයක් අමතර කොටස් සහිතව මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් වර්ෂය 01 මාස 02 දින 14 ක හා වර්ෂ 01 මාස 06 දින 07 ක කාලයක් ගතකර තිබීම හේතුවෙන් අදාල උපකරණය උපයෝගී කරගෙන සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) Cry/2A/Elisa Kit උපකරණය 2016 අගෝස්තු 29 දින ඇණවුම් කර රු.83,804 ක් ගෙවා තිබුණද සැපයුම්කරු විසින් උපකරණ නිර්දේශිත අවම උෂ්ණත්ව මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම හේතුවෙන් එය ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. මේ අනුව භාණ්ඩය මිලදී ගැනීමට ආයතනය විසින් වැය කරන ලද රු.83,804 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත්ව තිබූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකල අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) 2020 වර්ෂය වන විට ආයතනය පවත්වාගෙන යාම සඳහා ආයතනය තුලින්ම ස්වයං අරමුදල් සම්පාදනය කර ගැනීම හා 2017 වර්ෂයේදී ආයතනයේ ආදායම සියයට 26 කින් එනම් රු.මිලියන 62 කින් පමණ වර්ධනය කර ගැනීමේ අභිලාෂයෙන් ආයතනයේ දැනට පවතින කටයුතු අධ්‍යයනය කර එම ඉලක්කයන්ට ලඟා වීමේ යෝජනා ක්‍රමයක් සකස් කිරීම

වෙනුවෙන් 2016 ජුනි 01 දින සිට මාස 07 ක් සඳහා රු.1,340,500 ක් වැයකර අලෙවි ප්‍රවර්ධන උපදේශකයෙකු සේවයේ යොදවා තිබුණි. කෙසේ වුවද, වාර්තාවේ දින වන විටත් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණු අතර 2017 වර්ෂයේදී ආදායමද වැඩිවී තිබුණේ සියයට 7 කිනි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 392 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 317 ක් වීමෙන් පුරප්පාඩු 96 ක් හා අතිරික්ත 07 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රවර්ථන වර්ෂය තුළදී මාණ්ඩලික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 70 ක්ද, මාණ්ඩලික නොවන පුරප්පාඩු 16 ක්ද, අනෙකුත් කාර්ය මණ්ඩල පුරප්පාඩු 10 ක්ද පැවතුණි. පුරප්පාඩුව පැවැති තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 06 දෙනෙක් ස්ථිරව බඳවා ගැනීමට 2017 අගෝස්තු 20 දින පුවත්පත් දැන්වීමක් පළකර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

(ආ) පුරප්පාඩු තනතුරුවල කටයුතු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 14 දෙනෙකු බඳවා ගෙන තිබුණද ඒ සඳහා 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන චක්‍රලේඛය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව මාණ්ඩලික ශ්‍රේණියට අයත් ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි තනතුරක් සඳහා නිලධාරීන් දෙදෙනෙකු, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ කාර්මික සහායක තනතුර සඳහා නිලධාරියෙකු හා අනෙකුත් කාර්ය මණ්ඩලයේ සහායක තනතුරු 02 ක් සඳහා නිලධාරීන් 03 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. තවද, කළමනාකරණ සහකාර තනතුරේ අනුමත සංඛ්‍යාව ඉක්මවා එක් අයෙකු පත්කර තිබුණි.

## 4.4 අරමුදල් උපයෝජනය

එකතුව රු.1,101,625 ක් වූ බැංකු ගිණුම් ශේෂ 03 ක් අක්‍රීය බැංකු ගිණුම් ලෙස වසර 05 කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබූ අතර එම මුදල් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කරවීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට සුදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැතිවීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සුදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමීව දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම්කටයුතු භාවය හා සහපාලනය

**6.1 ප්‍රසම්පාදනය**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(i) මාර්ගෝපදේශ 4.1.1 (ඇ) ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී රු.7,721,841 ක් වටිනා ඩයල්ටෝ මීටරයක් මිලදී ගෙන තිබුණි. ඩයල්ටෝ මීටරය මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේ ලියවිලිවල පැහැදිලි ලෙස පිරිවිතර නොදැක්වීමෙන් හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ගණුදෙනුකරු සමඟ කතිකාවත් සිදු කිරීමෙන් තොරව වැඩිම මිල ගණන් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුගෙන් එකී උපකරණය මිලදී ගැනීමෙන් ආයතනයට රු.2,226,015 ක අලාභයක් සිදුවී තිබුණි.

(ii) මාර්ගෝපදේශ 6.2.2 ප්‍රකාරව ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමය යටතේ මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 42 කාල සීමාවක් ලබාදිය යුතු වුවත් ආයතනය වෙත ස්ටෙක් එයාර් කොලිටි මොනිටරින් පද්ධතියක් මිලදී ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 26 ක කාලයක් පමණක් ලබාදීමෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමේ තරඟකාරිත්වය අවම කරගෙන තිබුණි. තවද, 4.2.2 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණු අතර එම මිලදී ගැනීම සඳහා දින 455 ක කාලයක් ගතකර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය අනුව රු.500,000 ඉක්මවන සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් ගිවිසුමක් කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කළ යුතු වුවද ආරක්ෂක සේවාව, සනීපාරක්ෂක සේවාව හා කුලී පදනම මත වාහන ලබාගැනීම සඳහා ගිවිසුම්ගත වී නොතිබුණි. කෙසේ වුවද එම සේවාවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.28,947,912 ක වියදම් දරා තිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලසුමට අනුව රු.107,545,000 ක් වටිනා ජංගම නොවන වත්කම් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද එම වර්ෂයේදී රු.23,070,230 ක් වටිනා වත්කම් ප්‍රමාණයක් පමණක් මිලදීගෙන තිබුණි. මෙය මුළු ප්‍රමාණයෙන් සියයට 21 ක් පමණක් විය. 2017 සැප්තැම්බර් 30 දින වන විට 2016 සැලසුම්ගත ප්‍රසම්පාදනයන්ගෙන් රු.32,946,770 ක් වටිනා වත්කම් ප්‍රමාණයක් පමණක් මිලදීගෙන තිබුණි. 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුම අනුව වර්ෂය තුලදී රු.63,685,835 ක් වටිනා වත්කම් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.17,000,000 ක් වටිනා වත්කම් ප්‍රමාණයක් එනම්, සියයට 27 ක් පමණක් මිලදීගෙන තිබුණි. මේ අනුව ප්‍රසම්පාදන සැලැස්ම පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**6.2 අයවැය ලේඛනමය පාලනය**

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 5 සිට සියයට 63 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6.3 අභ්‍යන්තර විගණනය**

**------------------------**

2014 ඔක්තෝබර් 01 දින සිට පුරප්පාඩුව පවතින ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම් කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම් තැබීම සඳහා ආයතනයේ ක්‍රියාත්මක වන පරිගණක වැඩසටහන් ක්‍රමය අඩුපාඩු සහිත වීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | (i) භෞතික සත්‍යාපනය සිදු නොකිරීම.<br>(ii) ඌන උපයෝජිත වත්කම් පැවතීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු පැවතීම හා බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරවීම් නිරීක්ෂණය වීම. |
| (ඈ) | අයවැය පාලනය | අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් පැවතීම. |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන වාර්තාවල නිර්දේශවලට අනුකූලව ක්‍රියාමාර්ග නොගැනීම හා අභ්‍යන්තර විගණන අංශයේ තනතුරුවලට බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඊ) | මෙහෙයුම් පාලනය | කරගෙන යනු ලබන ව්‍යාපෘති නියමිත කාලයේදී සම්පූර්ණ නොකිරීම හා අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර නොගැනීම. |
| (උ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන නොසලකා කටයුතු කිරීම. |